# අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

## இலஞ்சம் அல்லது ஊழல் பற்றிய சார்த்துதல்களைப் புலனாய்வு செய்வதற்கான ஆணைக்குழு

## COMMISSION TO INVESTIGATE ALLEGATIONS OF BRIBERY OR CORRUPTION

තැ. පෙ. 1431, 36, මලලසේකර මාවත, කොළඹ 7. • த. பெ. 1431, 36, மலலசேகர மாவத்தை, கொழும்பு 7. • P. O. Box 1431, 36, Malalasekera Mawatha, Colombo 7.
දුරකථන අංක / தொலைபேசி / Telephone: 2596365, 2596360 /1954  ෆැක්ස් / பெக்ஸ் / Fax: 2595045


2025.01.16 මාධ්‍ය නිවේදන අංක: 2025/003/R

ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති අධ්‍යක්ෂ
සියලු මාධ්‍ය ආයතන

**<u>රු. 5,000/- ක (පන්දහසක) මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා එකී මුදලින් රු. 3,000/- ක (තුන්දහසක) මුදලක් ලබාගත් පොලිස් සැරයෙන්වරයෙක් අල්ලස් චෝදනා මත අත්අඩංගුවට</u>**

ලියන්නවත්ත වලගෙදර ප්‍රදේශයේ පුද්ගලයෙකු විසින් කරන ලද පැමිණිල්ලකට අනුව පැමිණිලිකරු 2025.01.14 වන දින ලොරි රථයකින් මතුගම නගරයේ සිට අගලවත්ත ප්‍රදේශයට යමින් සිටියදී එම මාර්ගයේ මතුගම ක්‍රිස්තියානි පල්ලිය අසලදී සැකකරු විසින් ලොරි රථය නවතා බලපත්‍ර පරික්ෂා කළ අවස්ථාවේ දී පැමිණිලිකරුගේ රියදුරු බලපත්‍රයේ බර වාහන පන්තියට අදාළ කාල සීමාව කල් ඉකුත්වී තිබූ බැවින් රියදුරු බලපත්‍රය සැකකරු භාරයට ගෙන නීති මගින් කටයුතු නොකර නැවත රියදුරු බලපත්‍රය රියදුරුට (පැමිණිලිකරුට) ලබා දීම සඳහා රු. 5,000/- ක මුදලක් ඉල්ලා එකී මුදලින් රු. 3,000/- ක මුදලක් අල්ලස් වශයෙන් ඉල්ලා ලබා ගැනීමේ චෝදනාව මත මතුගම මූලස්ථාන පොලිසියේ පොලිස් සැරයන්වරයෙක් 2025.01.15 වන දින ප.ව. 7.15 ට පමණ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන නිලධාරීන් විසින් අත්අඩංගුවට ගන්නා ලදී.

අත්අඩංගුවට ගන්නා ලද සැකකරු මතුගම මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.

**අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව**
0112502672